// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2474/31 - 2026 පෙබරවාරි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

DIK/LAN/02/49.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වනඉඩමේ/ පරවශතාවේ විස්තර*:

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 440 C, ගොඩඋඩ ග්‍රාම නිලධාරි වසමේ ගොඩඋඩ ගමේ පිහිටි මාතර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක කැ.සි. 820370 කලාප 03 පත්‍ර 01 දරන පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්

**01. කැබලි අංක 1**

ඉඩමේ නම: කොබෙයිගහ කොරටුව; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වතුර ටැංකියක් ඇත; හිමිකම් කියන අය: එෆ්. එච්. හේමපාල, ඩබ්ලිව්. කේ. ශ්‍රීමති මංගලිකා සහ තවත් අය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0417.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2026 මාර්තු මස 06 වැනි දින පෙ.ව. 10.00 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2026 පෙබරවාරි මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

මධුමතී එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2026 ජනවාරි මස 26 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0032

1A - G 046229 – 13 (2026/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*